


සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

1. 2kg න් $\frac{1}{8}$ක් g වලින් සොයන්න.

2. දී ඇති රටාවේ පොදු පදය සොයන්න.
   -2, -7, -12 -17, .............

3. රු. 450ට මිළදී ගත් පොතක් රු. 600 ට විකිණීමේ දී ලැබෙන ලාභ ප්‍රතිශතය සොයන්න.

4. $l$ වලින් දක්වන්න.
   i. $2500cm^3$
   ii. $375\,ml$

www.mathsland.org

5. සාධක සොයන්න. $x^2 + x - 2$

6. අගය සොයන්න.
   $11000_{දෙක} - 1111_{දෙක}$

7. පොදු පදය $T_n = 56 - 4n$ වූ සංඛ්‍යා රටාවක 3 වන හා 12 වන පදය සොයන්න.

8. PR=QS නම් PS=RQ බව පෙන්වන්න.




9. $\frac{(-2)(-8)}{(-3)(-6)}$ අගය සොයන්න.

10. පහත සංඛ්‍යා රටා වේ මාතය සහ මධ්‍යස්ථය සොයන්න.


20, 22, 27, 27, 35, 36, 36, 38, 39

www.mathsland.org


i. මාතය.

ii. මධ්‍යස්ථය

11. ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.



12.දී ඇති අගයන් අනුව රූපයේ පරිදි $x$ සහ $y$ හි අගය සොයන්න. AB හා CD සරල රේඛා දෙකකි.




13. සාධක දැනුම භාවිතයෙන් අගය සොයන්න. $(108^2 - 8^2)$

14.අගය සොයන්න.


i. $2.4 \times 0.3$ ii. $4 - 0.4 \times 0.3$

15.අගය සොයන්න.

$(-2) + (3.5) - (-2.5)$


www.mathsland.org

16.පරිමිතිය සොයන්න.



17. ත්‍රිකෝණ සංඛ්‍යා රටාවේ 81 වන පදය සොයන්න.

18.




පසෙකින් දැක්වෙන රූපයේ $a^0$ හා $b^0$ අක්ෂර වලින් දක්වා ඇති කෝණයන් ගේ අගය සොයන්න.

19. $x = \frac{-2}{5}$ හා $y = -4$ නම් අගය සොයන්න.

i. $15x - 3y$ ii. $10x + y$

www.mathsland.org

20. විසඳන්න.

$$4\left(\frac{5x}{2} - 5\right) - 3x - 6 = 0$$

පුෂ්පදාන බාලිකා විද්‍යාලය - මහනුවර

පළමු වාර පරීක්ෂණය - 2019

9 ශ්‍රේණිය

| | |
|---|---|
| විෂය - | ගණිතය (32-S) |
| ප්‍රශ්න පත්‍රය - II | කාලය - පැය 3යි |

**ප්‍රශ්න 6 න් ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

1. පියෙක් තමා සතු ඉඩමෙන් $\frac{1}{4}$ ක් තම දියණියට ද, $\frac{1}{3}$ ක් තම පුතුට ද ලබා දෙන ලදි. දියණිය තමා ට ලැබුණ කොටසින් $\frac{1}{9}$ ක් ද පුතා තමාට හිමි වූ කොටසින් $\frac{1}{6}$ ද තම මවට දෙන ලදි. ඇය තමාට හිමි වූ කොටසින් $\frac{3}{5}$ ක් පුණ්‍ය ආයතනයකට පරිත්‍යාග කරන ලදි.


   i). පුතාට හා දියණියට ලබා දුන් ප්‍රමාණය මුළු ඉඩමින් කුමන භාගයක් ද? (ල 03)

   ii). මවට හිමි වූයේ මුළු ඉඩමෙන් කවර භාගයක් ද? (ල 05)

   iii). මව විසින් පරිත්‍යාග කරන ලද්දේ මුළු ඉඩමෙන් කවර භාගයක් ද? (ල 04)

www.mathsland.org

2.



ඉහත රූපයන් ගෙන් පෙන්වා ඇත්තේ ගිනිකූරු යොදා ගනිමින් සාදන ලද රටාවකි.

i). රටා වේ පළමු රටා හතරේ ඇති ගිනිකූරු ගණන වෙන් වෙනම සොයන්න.(ල 02)

ii). ඉහත ගිනිකූරු රටා වේ පොදු පදය සොයන්න. (ල 03)

www.mathsland.org

iii).20 වන රටාව සෑදීම සඳහා ගිනිකූරු කීයක් අවශ්‍ය වේද? (ල 02)

iv).ගිනිකූරු 43 ක් ඇත්තේ කීවන රටා වේද? (ල 02)

v). ii වන ප්‍රශ්නයේ දී ලබා ගත් පොදු පදය යොදා ගනිමින් (n+1) වන රටාව සෑදීම සඳහා අවශ්‍ය ගිනිකූරු ගණන සොයන්න. (ල 03)

3. (a) තැරැව්කරුවකු විසින් ඉඩමක් විකිණීම සඳහා 5% ක කොමිස් මුදලක් ලබා ගනී. ඉඩම රු. 6 000 000 /= කට විකිණුවේ නම්

i). කොපමණ මුදලක් තැරැව් ගාස්තු වශයෙන් ගෙවිය යුතු ද?

ii). තැරැව්කරුගේ කොමිස් මුදල ගෙවූ පසු ඉඩම් හිමියාට හිමි වන මුදල කොපමණ ද?


(b) මේසයක් සෑදීම සඳහා නිෂ්පාදන වියදම වශයෙන් රු. 8000 මුදලක් වඩුවෙක් වැය කරන ලදි. ඔහු එම මේසය 25% ක ලාභයක් තබා ගනිමින් වෙළෙන්දෙකුට අලෙවි කරන ලදි. වෙළෙන්දා 30% ලාභයක් තබා ගනිමින් භාණ්ඩයේ මිල ලකුණු කරන ලදි.

www.mathsland.org

i). වෙළෙන්දා මේසය මිල දී ගැනීම සඳහා කොපමණ මුදලක් වැය කලේ ද?

ii). පාරිභෝගිකයා මේසය මිල දී ගැනීම සඳහා කොපමණ මුදලක් වැය කලේ ද?

4. $(a)$





www.mathsland.org

i). $x$ හි අගය සොයන්න.

ii). $p$ හා $q$ හි අගය වෙන වෙනම සොයන්න.

$(b)$




AB//CD නම්

$a + b + c = 180^0$ බව පෙන්වන්න.

5. ටැංකියක දිග, පළල හා උස පිළිවලින් 2m, 1.8m සහ 25m වේ.

i). ටැංකියේ ධාරිතාව ලීටර් වලින් සොයන්න.

www.mathsland.org

ii). මිනිත්තුවකට 180 $l$ වේගයෙන් පයිප්පයකින් ජලය ගලා ඒ නම් ටැංකිය සම්පූර්ණයෙන් පිරීමට ගත වන කාලය සොයන්න.

iii). දිනකට පුද්ගලයෙකු ගේ පාරිභෝජනය සඳහා 150 $l$ ක් අවශ්‍ය වේ නම් සාමාජිකයන් 4දෙනෙකුගෙන් යුත් පවුලකට මෙම ටැංකියේ ජලය දින කීයකට ප්‍රමාණවත් වේද?

6. i). වරහන් ඉවත් කරන්න. $(-5m)(x - 2m)$

ii). $a^2 - a - 12$ සාධක දෙකක ගුණිතයක් ලෙස ලියන්න.

www.mathsland.org

iii). $(x - 8)(x + 5) = x^2 - 3x - 40$ බව $x = 5$ වන විට දී සත්‍ය බව පෙන්වන්න.

iv). අඳුරු කළ කොටසේ වර්ගඵලය සොයන්න.

